# 4
# සේවකයාණෝ

## ❖ දුක් උසුලන සේවකයාණෝ :

පැරණි ගිවිසුමේ මුලින් ම සේවකයා ලෙස හඳුන්වා ඇත්තේ සෙනඟ
පසු කලෙක සේවකයන් වශයෙන් දුක් විඳි පුද්ගලයන්. ( උදාහරණ සහිත ව)
නව ගිවිසුමේ සේවකයාණෝ
එතුමාණන් සේවක භාවය පිළිබඳ ව ඉදිරිපත් කළ ඉගැන්වීම්.
සේවය වරප්‍රසාදයක් ලෙස සලකා සමාජය තුළ ක්‍රියා කිරීමට කිතුනුවන්ට මෙම ඉගැන්වීම්වලින් ලැබෙන මඟ පෙන්වීම.
(අ.පො.ස (සා.පෙ) විභාගය 2005 දෙසැම්බර් ක්‍රිස්තුධර්මය II : 2 ඊ )

එබෙද් යාහ්වේ = දෙවියන් වහන්සේ සේවකයා

## ❖ පරණ ගිවිසුම තුළ :

දේව කැමැත්ත තුළ ජීවත්වෙමින්
තම පසුබිම තුළ කැඳවීම වටහා ගනිමින්
දුක් විඳීමේ සේවයට හවුල් වූ අය

නිදසුන් :

ආබ්‍රහම් : තම මව් බිම අත හැර නොදන්නා දේශයකට යාමට කැමති විය.

මෝසෙස් : පීඩිත ව සිටි ජනතාව විවිධාකාර අභියෝග සහ දුෂ්කරතා මැද පොරොන්දු දේශයට ගෙන ඒම.

යෙසායා : දෙවන විප්‍රවාසයට පෙර දකුණු රාජ්‍ය පූජකයකු හා දිවැසියරයකු ලෙස ජීවත් විය. (ක්‍රි පූ 742987 අතර)

යෙරමියා : දෙ වන විප්‍රවාසය පිළිබඳ ව දිවැස් වැකි පවසා ඒ වෙනුවෙන් දුක් විඳී ය.

| | | |
|---|---|---|
| එසකියෙල් | : | විප්‍රවාසි ජනතාවට බලාපොරොත්තුවේ වදන් පැවසී ය. (ක්‍රි. ව. 586 යෙරුසලම වැටීමට පසු) |
| ඉතිරි වූ කුඩා ජනතාව | : | ක්‍රි. පූ. 533 සයිරස් නම් පර්සියානු අධිරාජ්‍යයාගේ නියමය ලෙස බබිලෝනියෙන් පිටත් ව පැමිණි ජනතාව. මොවුනට යුදෙව් යන නම යෙදේ. යේසුස් වහන්සේ උපන්නේ මෙම ජාතියට යි. |
| පරිපූර්ණ ඊශ්‍රායෙලය | : | යෙසායා 11:19 තෙක් ඇති යුක්තිය හා සාධාරණත්වය මත පදනම් වූ ආමොස් 5:24 ඇති ලෙස යුක්තිය හා ධර්මිෂ්ඨකම මූලික කොට සැලකූ ජනතාවකි. මින් පරිපූර්ණ සම්බන්ධතා ඇති තත්ත්වයන් හඟවයි. |

## ❖ යෙසායා දුටු සේවකයා :

### 1. යෙසායා 42 : 1 - 4

- යුක්තිය ඉටු කරමින් ලෝකය තුළ ජීවත් වේ.
- කෲරත්වය පිටු දකී.
- ප්‍රේමය අවිය කොට සලකයි.

### 2. යෙසායා 49 : 1 - 6

- මව්කුස තුළදී ම ලබන කැඳවීම.
- අඳුරු ලොවට ආලෝකය වී.
- දේව මග පෙන්වීම හා ආරක්ෂාව නිරතුරු ලබයි.

### 3. යෙසායා 50 : 4 - 9

- දුෂ්කරතා හා බාධක මැද ජීවත් වේ.
- දේව ශක්තිය තුළින් තම මෙහෙය ඉටු කරයි.

### 4. යෙසායා 52 : 13 - 53 : 12

- මන පිනවන රූපවත්කමක් නැත .
- මිනිසුන් විසින් පිළිකුල් කොට එපා කරනු ලැබී ය.
- අපගේ දුක උසුලයි.
- අපගේ පාපය තමන් පිටට ගනී.
- නිහඬ ව දුක් දරා ගනී.
- ලෝකයේ පව් උදෙසා මරණු ලබයි.
- එම මරණය පව් කමාකරන පූජාවක් වේ.
- එතුමන් ලත් දඬුවමෙන් අපට සුවය ලැබේ.

නව ගිවිසුම තුළ දේවදාසයා = යේසුස් වහන්සේ

පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේගේ සේවකයා ලෙස දැක් වූ සියලු අංග පරිපූර්ණත්වයට පත්වන්නේ යේසුස් වහන්සේ තුළින් ය.

තම සේවය අරඹන විට යේසුස් වහන්සේ යොහාන්ගෙන් යොර්දාන් ගඟේ, බව්තිස්මය ලැබීමට පැමිණි විට යොහාන් එතුමන් ඇමතුවේ,

**" මෙන්න, ලෝකයේ පාපය දුරලන**
**දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ ! " යනුවෙනි.**
ශු. යොහන් 2ඃ29

උත්පත්ති 22 පරිච්ඡේදයේ ආබ්‍රහම් ඊසාක් ව පූජා කිරීමට සැරසෙන විට එහි පූජා වූයේ බැටළුවෙකි. එයට වසර 2000 කට පසු එම බැටළුවාගේ ස්ථානය ගත්තේ යේසුස් වහන්සේ ය. එය වූයේ කල්වාරියේ කුරුසයක දී ය. එතුමාගේ මරණයෙන් අපට පව්සමාව ලැබෙන අතර නව දැක්මකින් යුත් නව ජීවිතයක් කරා යොමු වීමට දොර හැරේ. ක්‍රියා 8ඃ3234 සඳහන් ලෙස මුල් සභාව යෙසායා 52ඃ1353ඃ12 හුදෙක් යේසුස් වහන්සේ මත සම්පූර්ණ වූ දිවැස් වැකියක් ලෙස සැලකී ය. යේසුස් වහන්සේගේ මරණය මුළු ලෝකයාගේ පව් උදෙසා **සම්පූර්ණ** වූ **සමාප්ත** වූ **සෑහෙන්නා** වූ පූජාවක් විය.

## ❖ සාකච්ඡා ප්‍රශ්න ඇගැයීම ඃ-

1. " මරන්න ගෙනයන බැටළුවකු සේ ද බැටළු දෙනක ලොම් කපන්නා ඉදිරියේ ගොළු ව සිටින සේ ද එතුමෝ මුඛය නැර සිටියහ."
   මෙම ප්‍රකාශයේ අවස්ථා සම්බන්ධය ලියන්න.

2. දෙවියන් වහන්සේගේ සේවකයාණෝ හෙවත් දුක් උසුලන සේවකයාණෝ අද අපට කවරාකාර මග පෙන්වීමක් ලබා දෙයි ද?
   - දුක් විඳින අය සමඟ දුක් විඳීමට හවුල් වීම
   - පරිත්‍යාගශීලි බව
   - සම්පත් බෙදා ගැනීම
   - සමානාත්මතාව
   - හඬක් නැති අය උදෙසා පෙනී සිටීම

     උදාඃ
     1. ගබ්සා වන කලළ
     2.අඩු චේතනයට රැකියාව කරන අධ්‍යාපනය නොලත් මෙහෙකරුවන් / මෙහෙකාරියන්